&× ´ {ÆæÈ à`Ñ Í ó
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

6 ශ්‍රේණිය

# නර්තනය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකය:

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 තාලම්පටින් නිපදවෙන හඬ ගණනින් කොපමණ ද?

(1) දෙකකි. (2) හතරකි. (3) තුනකි. (4) හයකි.

02 පා සරඹ නටා අවසන් කරන්නේ,

(1) කස්තිරමෙනි. (2) හමාර පදයෙනි. (3) තීරුමානමෙනි. (4) අඩව්වෙනි.

03 උඩරට නැටුමේ එන ගොඩ සරඹ කීයක් වේද?

(1) 12 කි. (2) 18 කි. (3) 24 කි. (4) 16 කි.

04 පහතරට නැටුම් සම්ප්‍රදායට අනුව අත් සරඹ හඳුන්වන සරඹ නාමය වන්නේ,

(1) ගොඩ සරඹ (2) දොඹින පද (3) තාල සරඹ (4) ඉලංගම් සරඹ

05 දෙවොල් බෙරයට මේ නම් ද භාවිතා කෙරේ

(1) යක් බෙරය, දඬු බෙරය (2) සෝෂක බෙරය, දවුල් බෙරය

(3) සෝෂක බෙරය, රුහුණු බෙරය (4) යක් බෙරය, පොකුරු බෙරය

06 /1 2 3 4 | /1 2 3 4 මෙම තිත් රූපය කුමක් ද?

(1) සුළු තනි තිත (2) මහ තනි තිත

(3) මැදුම් තනි තිත (4) සුළු මහ දෙතිත

07 නූතන සන්නිවේදන ක්‍රම නිසා ජනතා භාවිතයෙන් බැහැර වූ භාණ්ඩයකි.

(1) තම්මැට්ටම (2) ගැට බෙරය (3) අණ බෙරය (4) දඬු බෙරය

08 ගැමි නැටුම්වලට අයත් නොවන්නේ,

(1) මේවර කෙළිය (2) ලී කෙළි නැටුම

(3) කළගෙඩි නැටුම (4) වන්නම්

09 ''බෝ අත්තට වැඳ සිරස නමන්නේ ....'' මෙය,

(1) පැල් කවියකි. (2) ගොයම් කවියකි.

(3) නැළවිලි කවියකි. (4) ලී කෙළි කවියකි.

10 ''තෙයි කිත තෙයි තාම්'' මෙය,

(1) පළමුවන ගොඩ සරඹයයි. (2) දෙවන පා සරඹයයි.

(3) පා සරඹ හමාර පදයයි.(4) පළමු පා සරඹයයි. (ල. 10)

- **නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

ශ්‍රී ලංකාවේ සිංහල නැටුම් සම්ප්‍රදායන් ප්‍රධාන වශයෙන් 11 ...................................... කි. එනම් උඩරට, සබරගමු හා 12 .................................... වේ. සබරගමු නැටුම් සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ 13 .................................. ය. 14 ............................ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන උඩරට බෙරය 15 .................................. නමින්ද හඳුන්වනු ලැබේ. (ල. 10)

- **පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16 දෙවොල් මඩුව උඩරට නැටුමේ එන ශාන්තිකර්මයකි. ( )

17 උඩරට නැටුමේ පා සරඹ සබරගමු නැටුමේ හඳුන්වන්නේ දොඹින පද යනුවෙනි. ( )

18 පාද සමග දැත් හුරුකරනුයේ වන්නම් නැටීමෙනි. ( )

19 ගැමි ගායනා ඉතා සරලය . ( )

20 තාලයක් තැබීමට අවශ්‍ය අඩුම මාත්‍රා ගණන දෙකකි. ( )

- **යා කරන්න.**

| | | | |
|---|---|---|---|
| 21 තාලම්පට | ● | අලුත් අවුරුද්ද | |
| 22 පෙරහැර | ● | තිත් / තෙයි | (ල. 10) |
| 23 ඔන්චිලි වාරම් | ● | කළගෙඩි | |
| 24 ගැමි නැටුම් | ● | කොහොඹා කංකාරිය | |
| 25 උඩරට | ● | ගිනිබෝල | |

## II කොටස

- **තෝරාගත් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) පා සරඹ හමාර පදය ලියන්න. (ල. 05 )

(2) පළමු හා දෙවන ගොඩ සරඹවල කස්තිරම් ලියන්න. ( ල . 05)

02 (1) තනි තිතේ ප්‍රභේද නම් කරන්න. (ල. 03)

(2) මැදුම් තනි තිතට බෙර පදයක් ලියන්න. (ල. 02)

(3) ඔබ ඉගෙන ගත් රබන් පදයක් ප්‍රස්ථාර කරන්න. ( ල . 05)